# 2020

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT



දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை
**Inland Revenue Department - Sri Lanka**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# වාර්ෂික
# කාර්ය සාධන වාර්තාව
# 2020

වැය ශීර්ෂ අංකය 246

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
සර්. චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

# පටුන


| | | |
|---|---|---|
| වගු ලේඛනය | | iii |
| සටහන් ලේඛනය | | iv |
| කෙටි යෙදුම් ලේඛනය | | v |
| **01 වන පරිච්ඡේදය** | **ආයතනමය පැතිකඩ** | |
| 1.1 | හැඳින්වීම | 3 |
| 1.2 | දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක | 4 |
| 1.3 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් | 5 |
| 1.4 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන් | 5 |
| 1.5 | සංවිධානමය සටහන | 6 |
| **02 වන පරිච්ඡේදය** | **ප්‍රගතිය සහ අනාගත දැක්ම** | |
| 2.1 | 2020 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන් | 9 |
| 2.2 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත අරමුණු | 22 |
| **03 වන පරිච්ඡේදය** | **වර්ෂය සඳහා වන මූල්‍ය කාර්ය සාධනය** | |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 27 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 29 |
| 3.3 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 30 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් | 32 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 46 |
| 3.6 | වෙන් කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය | 47 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන | 47 |
| 3.8 | මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 47 |
| 3.9 | විගණකාධිපති වාර්තාව | 48 |
| **04 වන පරිච්ඡේදය** | **කාර්ය සාධන දර්ශක** | |
| 4.1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන දර්ශක | 51 |
| **05 වන පරිච්ඡේදය** | **තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ කාර්ය සාධනය (SDG)** | |
| 5.1 | තිරසාර සංවර්ධන ඉලක්ක | 55 |
| **06 වන පරිච්ඡේදය** | **මානව සම්පත් පැතිකඩ** | |
| 6.1 | කාර්ය මණ්ඩල කළමනාකරණය | 61 |
| 6.2 | මානව සම්පත් සංවර්ධනය | 62 |
| **07 වන පරිච්ඡේදය** | **අනුකූලතා වාර්තාව** | |
| 7.1 | අනුකූලතා වාර්තාව | 67 |
| ඇමුණුම | | |

# වගු ලේඛනය


| | | |
|---|---|---|
| වගුව | 2:1 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු |
| වගුව | 2:2 | අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2020 වර්ෂයේ දී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු |
| වගුව | 2:3 | මුළු ආදායම රැස් කිරීම |
| වගුව | 2:4 | ආදායම් රැස් කිරීම සැසඳීම - 2020 සහ 2019 |
| වගුව | 2:5 | රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට (පවත්නා මිල ගණන් යටතේ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය |
| වගුව | 2:6 | බදු ආදායම් රැස් කිරීම් පළාත් සභාවලට මාරු කිරීම - 2020 |
| වගුව | 2:7 | 2020.12.31 දිනට ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව |
| වගුව | 2:8 | ආදායම් රැස් කිරීම මුළු වියදම හා රැස් කිරීමේ පිරිවැය (රුපියල් මිලියන) |
| වගුව | 2:9 | ජනතාව සඳහා 2020 වර්ෂයේදී පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් |
| වගුව | 2:10 | 2015/2016 සිට 2019/2020 දක්වා ආදායම් බදු වාර්තා අනුකූලතාවය |
| වගුව | 2:11 | එකතු කළ අගය මත බදු වාර්තා අනුකූලතාවය |
| වගුව | 2:12 | බදු සීමාවන් සහ අනුප්‍රමාණ |
| වගුව | 2:13 | සේවාන්ත ප්‍රතිලාභ සඳහා වන බදු සීමාවන් සහ අනුප්‍රමාණ |
| වගුව | 2:14 | හවුල් ව්‍යාපාර ආදායම් සඳහා බදු සීමාවන් සහ අනුප්‍රමාණ |
| වගුව | 2:15 | 2020 වර්ෂය තුළ පළ කෙරුණු ගැසට් නිවේදනය |
| වගුව | 4:1 | 2020 වර්ෂයේ කාර්ය සාධන දර්ශක |
| වගුව | 5:1 | තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් |
| වගුව | 6:1 | 2020.12.31 දිනට කාර්ය මණ්ඩලය |
| වගුව | 6:2 | 2020 වර්ෂයේ දී පවත්වන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් |

# සටහන් ලේඛනය


සටහන 2:1 මුළු ආදායම රැස් කිරීම - 2020

සටහන 2:2 ආදායම් රැස් කිරීම සැසඳීම - 2020 සහ 2019

සටහන 2:3 රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ආ.බ. | ආදායම් බදු |
| ප්‍රා.ලා.බ | ප්‍රාග්ධන ලාභ බද්ද |
| එ.අ.බ. | එකතු කළ අගය මත බද්ද |
| ජා.ගො.බ | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ආ.සේ.ගා. | ආර්ථික සේවා ගාස්තු |
| ණ.ආ.බ. | ණය ආපසු ගෙවීමේ බද්ද |
| ඔ.සූ.බ. | ඔට්ටු හා සූදු බද්ද |
| කො.ග.බ. | කොටස් ගනුදෙනු බද්ද |
| වා.හි.බ. | වාහන හිමිකම් බද්ද |
| වි.බ. | විගමන බද්ද |
| මු.බ. | මුද්දර බද්ද |
| භා.සේ.බ. | භාණ්ඩ හා සේවා බද්ද |
| පි.බ. | පිරිවැටුම් බද්ද |
| ජා.ආ.බ. | ජාතික ආරක්ෂණ බද්ද |
| ඉ.ක.බ. | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද |
| උ.වි.ගෙ. | උපයන විට ගෙවීම් |
| ත.ආ.බ. | තනි පුද්ගල ආදායම් බද්ද |
| හ.ආ.බ. | හවුල් ව්‍යාපාර ආදායම් බද්ද |
| ර.ගැ.බ. | රඳවා ගැනීමේ බද්ද |
| ස.ආ.බ. | සංස්ථාපිත ආදායම් බද්ද |
| අ.පු.ආ.බ. | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද |
| අ.ආ.බ. | අත්තිකාරම් ආදායම් බද්ද |

# 1 වන පරිච්ඡේදය

## ආයතනමය පැතිකඩ

## 1.1 හැඳින්වීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් රටට ආදායම් උත්පාදනය කිරීමේ මහඟු කාර්යභාරයක නිරත වී සිටින දෙපාර්තමේන්තුවකි. දෙපාර්තමේන්තුව රජයේ ආදායමෙන් 50%කට වඩා වැඩි ප්‍රමාණයක් එක්රැස් කර ගැනීමට සිය දායකත්වය සපයයි. කෙසේ නමුදු කෝවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2019 වර්ෂයට සාපේක්ෂව බදු ආදායම එකතු කිරීමේ අඩුවීමක් දක්නට ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පළමුවන කොමසාරිස්වරයා හෙවත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වූයේ හොක්ස්හැම් මහතා වන අතර වර්තමානයේ කොමසාරිස් ජනරාල් ධූරය එච්. එම්. ඩබ්ලිව්. සී. බණ්ඩාර මහතා විසින් හොබවයි. ඔහු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 33 වන දෙපාර්තමේන්තු ප්‍රධානියාය. දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වර්ෂ 1932 දී ආරම්භ කළ අතර 1933 දී දේපළ බදු සහ මුද්දර බදු දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වුණි. ආරම්භක අවස්ථාවේදී නිලධාරීන් විසිහතර දෙනෙකු සහ ලිපිකරුවන් හැත්තෑහත් දෙනෙකු සේවයේ නිරත වූ මෙම දෙපාර්තමේන්තුව, 2020 වර්ෂයේ අග භාගය වන විට දේශීය ආදායම් සේවයේ නිලධාරීන් 1,036 සහ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් 1,515කින් සමන්විත කාර්ය මණ්ඩලයකින් යුක්ත විය. ධූරාවලිය අනුව එක් කොමසාරිස් ජනරාල්වරයෙකු, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු 09 දෙනෙකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු 22 දෙනෙකු, කොමසාරිස්වරු 90 දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරු, නියෝජ්‍ය කොමසාරිස්වරු සහ සහකාර කොමසාරිස්වරු 1,107 දෙනෙකු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජකාරීවල නිරතව සිටිති.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දැක්ම වන "මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව පූර්ණ වශයෙන් පරිගණකගත කරන ලද පද්ධතියකින් සමන්විත වූ බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත් වීම" අත්පත් කර ගැනීම උදෙසා කටයුතු කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇප කැප වී සිටියි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ පිහිටා ඇති අතර අංශ කීපයක් නවම් මාවතේ සහ නාරාහේන්පිට මෙහෙවර පියසේ පිහිටා ඇත. අංක 402 දරණ 2002 සැප්තැම්බර් 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 වගන්තිය අනුව මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර සහ උපාය මාර්ගික ඉලක්ක

### දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි බදු හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත්වීම

### මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණ පනත් වලට යටත්ව බදු අය කිරීම

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, එක සමානව, ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම

### උපාය මාර්ගික ඉලක්ක

ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩසටහන් ඔස්සේ බදු නීතිරීති කෙරෙහි ඔවුන් ස්වේච්ඡාවෙන් එකඟ කරවා ගැනීම, වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හිදී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම

වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පෙරදැරි කරගෙන වඩාත් ඵලදායී අයුරින් දායක වීමට හැකිවනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම

## 1.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

- දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ විෂය පථය යටතේ වන්නා වූ සියළු අණ පනත් පරිපාලනය කිරීම
- රාජ්‍ය බදු ආදායම රැස් කිරීම
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රතිචාර ලබා දීම

## 1.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- පාරිභෝගික සේවා හා ප්‍රවර්ධන අංශය
- විශාල සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
- ඉහළ සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
- මධ්‍ය සංස්ථාපිත අනුකූලතා හා විගණන අංශය
- සංස්ථාපිත නොවන අනුකූලතා හා විගණන අංශය
- මෙට්‍රෝ සහ ප්‍රාදේශීය අංශය
- අභියාචනා අංශය
- ආපසු ගෙවීම් අංශය
- හිඟ බදු අංශය
- ලේකම් අංශය
- ප්‍රභව බදු අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිපාලන අංශය
- වංචා වැලැක්වීමේ අංශය
- මානව සම්පත් හා වත්කම් පරිපාලන අංශය
- ගිණුම් අංශය
- ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘති අංශය

## 1.5 සංවිධානමය සටහන



# 2 වන පරිච්ඡේදය

## ප්‍රගතිය සහ අනාගත දැක්ම

## 2.1 2020 වර්ෂය තුල දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විශේෂිත ජයග්‍රහණයන්

### 2.1.1 වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ.

**වගුව 2.1: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු**

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බද්ද | 2017 අංක 24 දරන දේශීය අදායම් පනත |
| එකතු කළ අගය මත බදු (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) | 2003 අංක 07, 2004 අංක 13, 2005 අංක 06 සහ 2006 අංක 08, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17, 2014 අංක 7, 2015 අංක 11, 2016 අංක 20, 2018 අංක 25 සහ 2019 අංක 19 දරන පනත්වලින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 2015 අංක 14 දරනපනත මගින් සංශෝධිත 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක10 සහ 2011 අංක13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක13 දරන මුදල් පනත |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කලින් බලාත්මකව තිබූ දැනට අවලංගු කර හෝ අහෝසි කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් අය කාර්යයන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**වගුව 2.2 : අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් වර්ෂයේ දී ආදායම් රැස් කිරීම් සිදු කරන ලද බදු 2020**

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1991 අංක 52දරන ජාතිය රැක ගැනීමේ දායක බදු පනත, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් පනත, සංශෝධිත පරිදි |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, සංශෝධිත පරිදි |
| වාහන හිමිකම් බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත |
| ආර්ථික සේවා ගාස්තුව | 2007 අංක 15, 2008 අංක11, 2009 අංක 16, 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6, 2014 අංක 9, 2015 අංක 13, 2017 අංක 7 සහ 2018 අංක 33 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11, 2014 අංක 10, 2015 අංක 12, 2016 අංක 22, 2017 අංක 13, 2018 අංක 20 සහ 2019 අංක 20 දරන පනත් වලින් සංශෝධිත 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.2. මුළු ආදායම රැස් කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය තුළ දී රු. 523,933,624,905/- ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.)

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 523,934 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 501,385/- ක අඩු වීමක් පෙන්නුම් කරයි. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ***(RAMIS)*** ක්‍රියාත්මක කිරීම ඇතුළුව බදු අනුකූලතාවය වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියාමාර්ගය හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් මෙම ජයග්‍රහණය සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 38.30% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 91.06% ක අගයක් පෙන්වන අතර ශුද්ධ ආදායම (පළාත් සභාවලට සම්පූර්ණයෙන්ම මාරු කරන ලද මුද්දර ගාස්තු සහ පළාත් සභාවලට මාරු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 1/3 ක් හැර) වසර සඳහා ඇස්තමේන්තුවෙන් 88.84% ක් විය.

**වගුව 2.3: මුළු ආදායම රැස්කිරීම**

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු.) | ආදායම් රැස් කිරීම (රු.) | රැස්කිරීම ඇස්තමේන්තුවේ % ක් | රැස්කිරීම් මුළු ආදායමට %ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 307,000,000,000 | 252,941,572,901 | 82.39% | 48.28% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 1,000,000,000 | 357,594,125 | 35.76% | 0.07% |
| එකතු කල අගය මත බද්ද | 241,000,000,000 | 233,786,120,184 | 97.01% | 44.62% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 3,400,000,000 | 3,002,271,834 | 88.30% | 0.57% |
| ඔට්ටු හා සූදු බද්ද | 2,500,000,000 | 1,428,071,291 | 57.12% | 0.27% |
| කොටස් ගණුදෙන බද්ද | 1,500,000,000 | 2,347,277,681 | 156.49% | 0.45% |
| විගමන බද්ද | 2,000,000 | 5,853,185 | 292.66% | 0.00% |
| මුද්දර බද්ද | - | 11,354,837,819 | - | 2.17% |
| ආර්ථික සේවා ගාස්තු | 16,000,000,000 | 14,950,042,437 | 93.44% | 2.85% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 3,000,000,000 | 3,740,463,661 | 124.68% | 0.71% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 226,221 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | - | 16,257,541 | - | 0.00% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 2,399,368 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | - | 636,657 | - | 0.00% |
| ප්‍රේෂණ බද්ද | 1,000,000 | - | - | 0.00% |
| **මුළු ආදායම් රැස් කිරීම** | **575,403,000,000** | **523,933,624,905** | **91.06%** | **100.00%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

සටහන 2.1: මුළු ආදායම රැස් කිරීම - 2020




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

වගුව 2.4: ආදායම් රැස් කිරීම සැසඳීම - 2020 සහ 2019

| බදු වර්ගය | 2020 ආදායම් රැස්කිරීම් (රු) | 2019 ආදායම් රැස්කිරීම් (රු) | රැස්කිරීමේ අඩුවීම හෝ වැඩිවීම ( %) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බද්ද | 252,941,572,901 | 371,795,681,316 | -31.97% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 357,594,125 | 602,439,115 | -40.64% |
| එකතු කළ අගය මත බද්ද | 233,786,120,184 | 443,877,131,612 | -47.33% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 3,002,271,834 | 28,673,572,980 | -89.53% |
| ඔට්ටු හා සූදු බද්ද | 1,428,071,291 | 2,435,982,807 | -41.38% |
| කොටස් ගණුදෙනු බද්ද | 2,347,277,681 | 1,023,443,599 | 129.35% |
| විගමන බද්ද | 5,853,185 | 5,008,044 | 16.88% |
| මුද්දර බද්ද | 11,354,837,819 | 14,863,016,823 | -23.60% |
| ආර්ථික සේවා ගාස්තු | 14,950,042,437 | 55,301,397,165 | -72.97% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 3,740,463,661 | 105,185,802,597 | -96.44% |
| භාණ්ඩ හා සේවා බද්ද | 226,221 | 17,036,964 | -98.67% |
| පිරිවැටුම් බද්ද | 16,257,541 | 29,626,965 | -45.13% |
| ජාතික ආරක්ෂක බද්ද | 2,399,368 | 9,045,921 | -73.48% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 636,657 | 1,219,286 | -47.78% |
| වාහන හිමිකම් බද්ද | - | 1,498,601,586 | -100.00% |
| ප්‍රේෂණ බද්ද | - | - | |
| **මුළු ආදායම් රැස් කිරීම** | **523,933,624,905** | **1,025,319,006,780** | **-48.90%** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

සටහන 2.2: ආදායම් රැස් කිරීම සැසඳීම - 2020 සහ 2019




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.3. රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

2020 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 2.5 වන වගුවෙන් පෙන්වන අතර, එම දායකත්වය 2.3 සටහනින් නිරූපණය කෙරේ. 2020 වසරේ රජයේ මුළු ආදායම රුපියල් මිලියන 1,367,960 ක් වූ අතර එයින් 38.30% ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත.

දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීමේ අගය ප්‍රතිශතයක් ලෙස ගත් විට 2020 වර්ෂය සඳහා 3.50% ක් වේ.

වගුව 2.5: රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට (පවත්නා මිල ගණන් යටතේ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය

| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදනය (රු. මිලියන) | දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2016 | 1,686,061 | 641,547 | 38.05% | 11,996,083 | 5.35% |
| 2017 | 1,831,531 | 836,518 | 45.67% | 13,328,103 | 6.28% |
| 2018 | 1,919,973 | 900,348 | 46.89% | 14,366,103 | 6.27% |
| 2019 | 1,890,899 | 1,025,319 | 54.22% | 15,016,142 | 6.83% |
| 2020 | 1,367,960 | 523,934 | 38.30% | 14,972,995 | 3.50% |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන 2.3: රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය




මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.4. මුද්දර බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස් කරනු ලබන පහත සඳහන් බදු, දක්වා ඇති ප්‍රතිශතයන්ගෙන් පළාත් සභා වලට මාරුකරන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු -මුළු එකතුවෙන් 33.33%

මුද්දර ගාස්තුව-මුළු එකතුවෙන් 100.00%

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස් කිරීම් ප්‍රමාණය සහ පළාත් සභාවලට මාරු කරන ලද මුදල 2.6 වන වගුවෙහි දැක්වේ.

වගුව 2.6: බදු ආදායම් රැස් කිරීම් පළාත් සභාවලට මාරු කිරීම - 2020

| | මුළු රැස්කිරීම් (රු.) | පළාත් සභාවලට මාරු කල ප්‍රමාණය (රු.) | % |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 3,740,463,661 | 1,389,286,496 | 33.33% |
| මුද්දර බද්ද | 11,354,837,819 | 11,354,837,819 | 100% |

මූලාශ්‍රය :දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.5. බදු ගෙවන්නන් ලියාපදිංචි වීමේ විස්තර

2020 වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විවිධ බදුකරණ කටයුතු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව අංක 2.7 වගුවෙහි දක්වා ඇත.

වගුව 2.7: 2020.12.31 දිනට ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව

| | | |
|---|---|---|
| ආදායම් බද්ද | | |
| ***සංස්ථාපිත*** | | |
| වාසික සමාගම්/නිර්වාසික සමාගම් | 60,721 | |
| ***සංස්ථාපිත නොවන*** | | |
| තනි පුද්ගල | 292,712 | |
| හවුල් ව්‍යාපාර | 16,949 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 804 | |
| උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ආදායම් බදු (උ.වි.ගෙ.) අත්තිකාරම් පුද්ගල ගෙවන සේවා නියුක්තියන් | 664,828 | |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **1,036,014** |
| **අනෙකුත් බදු ගෙවන්නන්** | | |
| එකතු කල අගය මත බදු (එ.අ.බ.) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 8,152 | |
| මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 239 | |
| ඔට්ටු හා සූදු බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 637 | |
| **මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **9,028** |
| උ.වි.ගෙ./අ.පු.ආ.බ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන් | 34,991 | |
| පොලිය මත රඳවාගැනීමේ /අත්තිකාරම් ආදායම් බදු සඳහා ලියාපදිංචි වූ රඳවාගැනීමේ/ අත්තිකාරම් ආදායම් බදු අනුයෝජිතයන් | 615 | |
| නිශ්චිත ගාස්තු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) මත රඳවා ගැනීමේ/අත්තිකාරම් ආදායම් බදු | 43,188 | |
| මුද්දර බදු (විධිමත් කාර්තුමය උපලේඛනගත සැපයුම්කරුවන්) | 9,609 | |
| | | **87,975** |
| **2020.12.31 දිනට මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **1,133,445** |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.6.ඵලදායිතා අනුපාතය

2020 වසරේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් මිලියන 4489.72 ක් වූ අතර, රැස් කළ ආදායම රුපියල් මිලියන 523,933.62 ක් විය. එබැවින් ඵලදායිතා අනුපාතය (එනම් වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස් කළ ආදායම) 117:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රුපියල් 100 ක් රැස් කිරීමේ පිරිවැය, ශත 86 ක් ලෙස ගණනය කෙරේ. ආනයනයේදී අය කරන ලද එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු හැර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ පිරිවැය රුපියල් 100 ක් සඳහා රු.1.03 ක් විය. (පෙර වර්ෂයේ දී අනුරූපී අගයන් පිළිවෙලින් ශත 44 සහ ශත 54 ක් විය.)

2018 - 2020 වසර දක්වා ආදායම් රැස් කිරීම, මුළු වියදම් සහ රැස් කිරීමේ පිරිවැයෙහි වර්ගීකරණය 2.8 වන වගුවෙහි දැක්වේ.

වගුව 2.8: ආදායම් රැස් කිරීම මුළු වියදම හා රැස්කිරීමේ පිරිවැය (රුපියල් මිලියන)

| විස්තරය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| **ආදායම් රැස් කිරීම** | | | |
| ආදායම් බද්ද | 257,366.66 | 371,795.68 | 252,941.57 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 104.14 | 602.44 | 357.59 |
| එකතු කල අගය මත බද්ද | 461,650.62 | 443,877.13 | 233,786.12 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 4,501.17 | 28,673.57 | 3,002.27 |
| ඔට්ටු හා සූදු බද්ද | 2,469.58 | 2,435.98 | 1,428.07 |
| කොටස් ගනුදෙනු බද්ද | 1,196.35 | 1,023.44 | 2,347.28 |
| විගමන බද්ද | 16.68 | 5.01 | 5.85 |
| මුද්දර බද්ද | 12,026.43 | 14,863.02 | 11,354.84 |
| ආර්ථික සේවා ගාස්තුව | 52,978.51 | 55,301.40 | 14,950.04 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 105,690.53 | 105,185.80 | 3,740.46 |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 17.04 | 0.23 |
| ප්‍රේෂණ බද්ද | 88.93 | 29.63 | 16.26 |
| ජාතික ආරක්ෂක බද්ද | 40.99 | 9.05 | 2.4 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 26.2 | 1.22 | 0.64 |
| වාහන හිමිකම් බද්ද | 2,191.68 | 1,498.60 | - |
| පිරිවැටුම් බද්ද | - | - | - |
| **මුළු එකතුව** | **900,348.47** | **1,025,319.01** | **523,933.62** |
| **වියදම** | | | |
| **පුනරාවර්තන වියදම්** | | | |
| පඩිනඩි | 2,433.27 | 2,712.91 | 2,736.63 |
| ගමන් වියදම් | 37.82 | 22.55 | 7.09 |
| සැපයුම් හා උපකරණ | 116.24 | 170.84 | 121 |
| නඩත්තු හා අළුත්වැඩියා | 72.65 | 142.41 | 158.78 |
| කොන්ත්‍රාත් සේවා | 737.22 | 720.17 | 593.2 |
| මාරුකිරීම් | 42.96 | 43.85 | 44.76 |
| වෙනත් (පාඩු හා කපාහැරීම්) | - | - | 0.22 |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් | 52.67 | 114.85 | 139.77 |
| අත්පත් කර ගැනීම් | 38.9 | 144.55 | 65.01 |
| ධාරිතා ගොඩනැංවීම | 180.92 | 42.8 | 19.74 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 288.84 | 364.27 | 227.6 |
| ආයෝජන (නව දේශීය ආදායම් පනත) | 132.81 | 55.93 | 375.92 |
| මුළු වියදම | 4134.3 | 4535.13 | 4489.72 |
| රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය | 0.46 | 0.44 | 0.86 |
| රු.100 ක් රැස් කිරීම සඳහා පිරිවැය (ආනයන මත එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආර්ථික සේවා ගාස්තු හැර) | 0.58 | 0.54 | 1.03 |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.7 බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

2020 වර්ෂය තුල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන් සහ බදු වෘත්තිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත. මෙම වැඩ සටහන් වල දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ බදු ගෙවන්නන්ට බදු නීතියේ වෙනස්වීම පිළිබඳව සහ ඊ-සේවාව හරහා බදු වාර්තා ගොනු කිරීම සම්බන්ධයෙන් දැනුම ලබා දීමයි.

**වගුව 2.9: ජනතාව සඳහා 2020 වර්ෂයේ දී පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන්**

| | විෂය | ආයතනය/ සහභාගී වූ පිරිස | සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අ.පු.ආ.බ. (අත්තිකාරම් පුද්ගල ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 500* |
| 2 | උ.වි.ගෙ.(උපයන විට ගෙවීම) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 500* |
| 3 | ස.ආ.බ. (සංස්ථාපිත ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 1200 ට වැඩි සහභාගීත්වයක් |
| 4 | පු.ආ.බ. (පුද්ගල ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 6700 ට වැඩි සහභාගීත්වයක් |
| 5 | හ.ව.ආ.බ. (හවුල් ව්‍යාපාර ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 1200 ට වැඩි සහභාගීත්වයක් |
| 6 | ස.ආ.බ. (සංස්ථාපිත ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 575 ට වැඩි සහභාගීත්වයක් |
| 7 | පු.ආ.බ. ඊ - පිරවීම (පුද්ගල ව්‍යාපාර ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 900 ට වැඩි සහභාගීත්වයක් |
| 8 | හ.ව.ආ.බ. ඊ - පිරවීම (හවුල් ව්‍යාපාර ආදායම් බදු) | සියළුම පාර්ශවකරුවන් (බදු ගෙවන්නන්/උපදේශකවරුන්) | 200 ට වැඩි සහභාගීත්වයක් |

* සංඛ්‍යාවන් ආසන්න වශයෙන්

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 2.1.8 වාර්තා අනුකූලතාවය

බදු ගෙවන්නා විසින් නියමිත වේලාවට බදු වාර්තා පිරවීම සහ ස්වයං තක්සේරු පදනම මත බදු ගෙවීම් අනුකූලතාවය ඉහල නැංවීම සඳහා වර්ෂය මුළුල්ලේ වැඩ සටහන් අඛණ්ඩව පැවැත්වුණි.

**වගුව 2.10: 2015/2016 සිට 2019/2020 දක්වා ආදායම් බදු වාර්තා අනුකූලතාවය**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට එක් මාසයක් තුල අනුකූලතාවය | 2021.02.28 දිනට අනුකූලතාවය |
|---|---|---|---|---|
| 2015/2016 | සංස්ථාපිත | 30% | 46% | |
| | සංස්ථාපිත නොවන | 48% | 59% | |
| 2016/2017 | සංස්ථාපිත | 41% | 45% | |
| | සංස්ථාපිත නොවන | 45% | 56% | |
| 2017/2018 | සංස්ථාපිත | 47% | 51% | |
| | සංස්ථාපිත නොවන | 31% | 38% | |
| 2018/2019 | සංස්ථාපිත | 47% | 50% | |
| | සංස්ථාපිත නොවන | 32% | 38% | |
| 2019/2020 | සංස්ථාපිත | 6% | 8% | 46% |
| | සංස්ථාපිත නොවන | 3% | 6% | 36% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

වගුව **2.11:** එකතු කල අගය මත බදු වාර්තා අනුකූලතාවය

| වර්ෂය | අනුකූලතාවය |
|---|---|
| 2018 වර්ෂය | 31% |
| 2019 වර්ෂය | 47% |
| 2020 වර්ෂය | 36% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් සං.ආ.බ., පු.ආ.බ. සහ හ.ව.ආ.බ. සඳහා වාර්තා භාරදීමේ දිනය 2021 පෙබරවාරි 28 වන දින දක්වා දීර්ඝ කරන ලදී. එහෙයින් සං.ආ.බ., පු.ආ.බ. සහ හ.ව.ආ.බ. වාර්තා භාරදීමේ අනුකූලතා අනුපාතයෙහි කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කරයි. කෙසේ නමුදු සහන කාලය අවසානයේ දී සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු වාර්තා ලබා දීමේ අනුකූලතාවය පිලිවෙළින් 46% සහ 30% දක්වා වැඩි වී ඇත.

### 2.1.9. 2020 වර්ෂයේ ආදායම් බදු සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

1. 2020 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රඳවා ගැනීමේ බදු (ලාභාංශ, පොළී, වට්ටම්, ගාස්තු, ස්වභාවික සම්පත් ගෙවීම්, කුළිය, රාජ්‍ය භාග, රක්ෂණ වාරික හෝ ඒ හා සමාන කාලපරිච්ඡේද ගෙවීම් සහ උපයන විට ගෙවීම (උ.වි.ගෙ.) ඉවත් කර අත්තිකාරම් ආදායම් බදු (අ.ආ.බ.) සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (අ.පු.ආ.බ.) හඳුන්වා දෙනු ලැබිණි.

2. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු වාසික හෝ නිර්වාසික පුද්ගලයන් සඳහා පහත පරිදි බදු සීමා සහ බදු අනුප්‍රමාණ හඳුන්වා දුනි.

වගුව **2.12.** බදු සීමාවන් සහ අනුප්‍රමාණ

| බදු අය කළ හැකි ආදායම | බදු අනුපාතය |
|---|---|
| පලමු රු. මිලියන 3 | 6% |
| ඊලඟ රු. මිලියන 3 | 12% |
| ඉතිරිය | 18% |

මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

3. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු සේවාන්ත ප්‍රතිලාභ බදුකරණයෙහි බදු සීමාවන් (විශ්‍රාම වැටුපක් පරිවර්තිත කිරීම, විශ්‍රාම පාරිතෝෂික, ධුරය හෝ සේවා නියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන් වන්දි මුදල් ලෙස ලැබූ මුදල් ප්‍රමාණ සහ සේවා නියුක්තික භාර අරමුදලෙන් ලැබූ මුදල් ප්‍රමාණ) ඉහළ නංවා ඇති අතර අදාල වන බදු අනුප්‍රමාණයන් පහත පරිදි සංශෝධනය කර ඇත.

4. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු සේවාන්ත ප්‍රතිලාභ බදුකරණයෙහි බදු සීමාවන් (විශ්‍රාම වැටුපක් පරිවර්තිත කිරීම. විශ්‍රාම පාරිතෝෂික, ධුරය හෝ සේවා නියුක්තිය අහිමිවීම සම්බන්ධයෙන් වන්දි මුදල් ලෙස ලැබූ මුදල් ප්‍රමාණ සහ සේවා නියුක්තික භාර අරමුදලෙන් ලැබූ මුදල් ප්‍රමාණ) ඉහළ නංවා ඇති අතර අදාල වන බදු අනුප්‍රමාණයන් පහත පරිදි සංශෝධනය කර ඇත.

වගුව **2.13:** සේවාන්ත ප්‍රතිලාභ සඳහා වන බදු සීමාවන් සහ අනුප්‍රමාණයන්

| මුළු සේවාන්ත ප්‍රතිලාභය | බදු අනුපාතය |
|---|---|
| පලමු රු.10,000,000 | 0% |
| ඊළඟ රු.10,000,000 | 6% |
| ඉතිරිය | 12% |

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

4. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු හවුල් ව්‍යාපාරයක බදු අය කළ හැකි ආදායම පහත සඳහන් අනුප්‍රමාණයන්ගෙන් බදු අය කෙරේ.

**වගුව 2.14 හවුල් ව්‍යාපාර ආදායම සඳහා බදු සීමාවන් සහ අනුප්‍රමාණ**

| තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කල හැකි ආදායම | ගෙවිය යුතු බදු |
|---|---|
| පලමු රු.1,000,000 | 0% |
| ඉතිරිය | 6% |

මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

5. 2020 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක ලැබීම් සහ ලාභ වල එවැනි වූ කොටස පහත අනුප්‍රමාණයන්ගෙන් බද්දට යටත් කළ යුතුය.

(අ) හුදෙක් වෙනත් ව්‍යාපාරයකට අනුෂාංගික වන එහි ලැබීම් සහ ලාභ හැර ඔට්ටු හා සූදු ව්‍යාපාරයකින් හෝ මත්පැන් විකිණීමෙන් වන එවැනි ලැබීම් සහ ලාභ ඉවත් කරමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකින් වන ලැබීම් සහ ලාභ - 14%

(ආ) විකුණුම් සඳහා ගෙවීම් ලෙස ලැබෙන විදේශ ව්‍යවහාර මුදල් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණ කරන අවස්ථාවකදී භාණ්ඩ හෝ වෙළඳ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම මගින් වන ලැබීම් සහ ලාභ -14%

(ඇ) විශේෂිත ව්‍යවසායක ලැබීම් සහ ලාභ - 14%

(ඈ) අධ්‍යාපන සේවා සැපයීමෙන් වන ලැබීම් සහ ලාභ - 14%

(ඉ) සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ව්‍යවසායක ලැබීම් සහ ලාභ - 14%

(ඊ) ඉදි කිරීම් සේවා සැපයීමෙන් වන ලැබීම් සහ ලාභ -14%

(උ) කෘෂි පිරිසැකසුම් මගින් වන ලැබීම් සහ ලාභ -14%

(ඌ) සෞඛ්‍ය සේවා සැපයීමෙන් වන ලැබීම් සහ ලාභ -14%

(එ) වාසික සමාගමකින් ලැබෙන ලාභාංශයන්ගෙන් වන ලැබීම් සහ ලාභ -14%

(ඒ) 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය විසින් ස්ථාපනය කර ඇති ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති ඕනෑම අපනයන සමාගමක් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ කොවිඩ් මධ්‍යස්ථානය සඳහා සෞඛ්‍ය ආරක්ෂක උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සැපයීම සම්බන්ධයෙන් වන ප්‍රතිෂ්ඨාවක් මගින් වූ ලැබීම් සහ ලාභ -14%

(ඔ) මෙම උප ඡේදයේ (අ), (ආ), (ඇ), (ඈ), (එ) සහ (ඒ) යන අයිතමයන්ට යටත්ව නිෂ්පාදනයෙන් වන ලැබීම් සහ ලාභ - 18%

(ඕ) ඔට්ටු හා සූදු ව්‍යාපාර පවත්වාගෙන යාමෙන් වන ලැබීම් සහ ලාභ -40%

(ක) මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමෙන් සහ විකිණීමෙන් හෝ ආනයනය සහ විකිණීමෙන් වන ලැබීම් සහ ලාභ - 40%

6. බදු නිදහස් කිරීම්

1. ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමැතිය සහිතව ඕනෑම වාණිජ බැංකුවක හෝ ඕනෑම විශේෂිත බැංකුවක, තමා විසින් හෝ තමා වෙනුවෙන් ආරම්භ කළ ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තම බැර වෙනුවෙන් මුදල් යෙදවීම මත ඕනෑම තැනැත්තෙකු විසින් 2020 ජනවාරි 01 වන දින හෝ එදිනට පසු උපචිත වන හෝ උපයන පොළිය මත බදු නිදහස් වේ.

2. විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල් වලින් නියම කළ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ( පසුව අළුත් කරන ලද ගිණුම් හැර) 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති අදාළ රෙගුලාසි වල නියම කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ බලය

පැවරූ වෙළඳ නියෝජිතයෙකු සමග විවෘත කර නඩත්තු කරනු ලබන “ විශේෂිත තැන්පතු ගිණුම “ ලෙස නම් කළ තැන්පතු ගිණුමකින් 2020 අප්‍රේල් 08 වන දින හෝ එදිනෙන් පසු යම් තැනැත්තෙකුට උපචිත වන හෝ උපයන පොළිය බද්දෙන් නිදහස් වේ.

3. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු වාසික සමාගමකින් තැනැත්තෙකුට ලැබෙන ලාභාංශ, එකී වාසික සමාගම එම ලාභාංශ ගෙවනු ලබන්නේ වෙනත් වාසික සමාගමකින් ලැබෙන ලාභාංශ වලින් නම්,

(i) නිර්වාසික තැනැත්තෙකු වන සාමාජිකයෙකුට;

(ii ) 2012 අංක 12 දරන මුදල් පනතේ (iv) වන කොටසේ විධිවිධාන අනුව සහ 1978 අංක 04 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති පහත සඳහන් ව්‍යාපාරයන් එකක හෝ ඉන් වැඩි ගණනක නිරත වූ :-

(අ) ආනයනය කිරීම සුලු වශයෙන් පිරිසැකසුම් කිරීම සහ ප්‍රති අපනයනය කිරීම හා සම්බන්ධතා යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාමක යෙදී සිටින,

(ආ) එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් එකත භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරවන වෙනත් රටකට නැව්ගත කිරීමේ අක් වෙරළ ව්‍යාපාරයක යෙදී සිටින,

(ඇ) විදේශයන්හි සේවාදායකයන් සඳහා අභිමුඛ සේවා සැපයීමේ යෙදී සිටින,

(ඈ) මූල්‍ය සැපයුම් ජාලය සහ බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලයීය මෙහෙයුම් කටයුතු වල යෙදී සිටින,

(ඉ) ශ්‍රී ලංකාවේ ඇති බන්ධිත ගුදම් හෝ බහු පාර්ශවීය ඒකාබද්ධ කිරීම් වැනි කාර්ය සම්පාදන සේවා වල යෙදී සිටින,

4. නියම කර ඇති පරිදි තොරතුරු තාක්ෂණ සහ සක්‍රීය සේවා සපයන ඕනෑම තැනැත්තෙකු විසින් 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු ඉපයූ හෝ උපයන ලැබීම් සහ ලාභ සඳහා

5. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු ශ්‍රී ලංකාව පිටත යම් තැනැත්තෙකු විසින් ප්‍රයෝජනයට ගැනීමට ශ්‍රී ලංකාව තුලදී හෝ ඉන් පිටතදී සපයනු ලබන සේවාවකින් ඕනෑම තැනැත්තෙකු එකී සේවාව සැපයීම සඳහා වන ගෙවීම විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණ කරන අවස්ථාවේදී ඉපයූ හෝ උපයන ලැබීම් සහ ලාභ සඳහා බදු නිදහස් කිරීම අදාල වේ.

6. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු ඕනෑම විදේශ මූලාශ්‍රයකින් ඕනෑම තැනැත්තෙකු විසින් ඉපයූ හෝ උපයන ලැබීම් සහ ලාභ [ (iii) වන උපජේදයේ සඳහන් ලැබීම් සහ ලාභ හැර ], එලෙස ඉපයූ හෝ උපයන ලද ලැබීම් සහ ලාභ විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන අවස්ථාවකදී බදු නිදහස් කිරීම් අදාල වේ.

7. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු TVET සංකල්පය (තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ) යටතේ ප්‍රමිතිගත සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් නියාමනය වන ඕනෑම වෘත්තීය අධ්‍යාපන ආයතනයක්;

(අ) එකී ආයතනය සලකන ලද කත්සේරු වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම ඊට පෙර තක්සේරු වර්ෂයේ සිසුන් බඳවා ගැනීමට සාපේෂව දෙගුණයක් කර ඇත්නම්; සහ

(ආ) 2021 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන පස් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා

ඉහත (අ) උප ජේදයේ කාර්යය සඳහා සලකන ලද පළමු වර්ෂයේ සිසුන් බඳවා ගැනීම දෙගුණයක් කර ඇති සහ එම බඳවා ගැනීමේ ප්‍රමාණය ඊළග වර්ෂ හතර ඇතුලත ද එලෙසම පවත්වා ගන්නා ආයතනයක් එකී වර්ෂයන් සඳහා පෙර කී අවශ්‍යතාවය සපුරාලන ආයතනයක් ලෙස සලකා ඉපයූ හෝ උපයන ලාභ සඳහා බදු නිදහස් කිරීම් අදාළ වේ.

8. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු:-

(i) රසායනාගාර සේවා හෝ ප්‍රමිතිකරණ සහතික සේවා මගින් ඕනෑම නිර්වාසික තැනැත්තෙකු;

(ii) ප්‍රදාන හෝ පරිත්‍යාග ලෙස විෂය භාර ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති ඕනෑම ආගමික ආයතනයක්, උපයන ඕනෑම මුදල් ප්‍රමාණයක් සඳහා බදු නිදහස් කිරීම අදාල වේ.

7. සුදුසුකම් ලබන සහන

1. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු වාසිකයෙකු හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු සඳහා පුද්ගලික සහනය රු.500,000/- සිට රු.3,000,000/- දක්වා ඉහළ නංවා ඇත.

2. 2020 ජනවාරි 01 වන දින හෝ එදිනෙන් පසු තක්සේරු වර්ෂයක් සඳහා දරණ ලද පහත වියදම් මුළු එකතුව රු.1,200,000 දක්වා වාසික පුද්ගලයෙකුට ඉල්ලුම් කිරීමට හැක.

(i) වෛද්‍ය රක්ෂණයකට වන දායක මුදල් ඇතුළුව සෞඛ්‍ය වියදම්

(ii) එකී පුද්ගලයා සඳහා හෝ එකී පුද්ගලයාගේ දරුවන් වෙනුවෙන් දේශීයව දරණ ලද අධ්‍යාපන වියදම්

(iii) නිවාස ණය මත යොමු පොළිය

(iv) අනුමත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයකට ගෙවූ දායක මුදල්

(v) කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හුවමාරු කොමිෂම හෝ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත (420 වන අධිකාරිය) යටතේ භාණ්ඩාගාර බිල්පත් හෝ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත (417 වන අධිකාරිය) යටතේ භාණ්ඩාගාර බිල්පත් මගින් බලපත්‍ර ලබා දී ඇති කොටස් හෝ වෙනත් යම් මූල්‍ය සාධන පත්‍ර මිලදී ගැනීම සඳහා දරන ලද වියදම.

8. වෙනත් සහන

කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන ඕනෑම බදු පනතක පටහැනිව කුමක් සඳහන් වුවද පහත දැක්වෙන තැනැත්තන් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන බදු පනතක් යටතේ දණ්ඩන විධි විධානයන් සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවක් හෝ යම් දණ්ඩනයක් පැනවීම හෝ යම් ක්‍රියාමාර්ගයක් ගැනීම ආරම්භ කිරීම සිදු නොකල යුතුය.

(i) එකී අණපනත් මගින් අවශ්‍ය කරන පරිදි කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු බදු නොගෙවූ හෝ එකී තැනැත්තා ප්‍රකාශ කර නොමැති මූලාශ්‍රයකින් මුදල් ඉපයූ අවස්ථාවක ; සහ

(ii) දළ ආයෝජන මුදල් ප්‍රමාණය මත කොමසාරිස් ජනරාල්වරයාට සියයට එකක අවසාන බද්දක් ගෙවීමට යටත් වන තැනැත්තන්,

9. පශ්චාත් කොවිඩ් -19 ආර්ථික පුනර්ජීවනය සඳහා වූ බදු සහන ක්‍රියාමාර්ග

1. ඕනෑම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් මගින් ගෙවිය යුතු ඕනෑම හිඟ ආදායම් බද්දක් එකී හිඟය, කොමසාරිස් ජනරාල්වරයාගේ සටහන් අනුව 2020 ජුනි 26 වන දිනට ගෙවීමට නියමිත, 2019 මාර්තු 31 වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය දක්වා සිදු කළ ඕනෑම තක්සේරුවක් (වාර්තා ප්‍රකාරව බදු ගෙවීම සඳහා සිදු කල තක්සේරු හැර) හේතුවෙන් උද්ගත වන්නේ නම්,

(අ) එකී ඇස්තමේන්තුව මෙම පනතේ විධිවිධාන හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධි විධාන හෝ 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන හෝ 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව සකස් කර ඇත්නම්

2. වාර්තාවේ ප්‍රකාශ කළ බදු ගෙවා ඇති එකී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය විසින් ආදායම හෝ ඕනෑම අඩු කිරීමක් හෝ සහන අනාවරණය කිරීමේදී වංචාවක් හෝ චේතනාන්විත පැහැර හැරීමක් සිදු වී නොමැති බවට සහකාර කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම් 2019/2020 තක්සේරු වර්ෂය සඳහා තක්සේරුවක් නිකුත් නොකෙරෙනු ඇත.

3. ඕනෑම සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යවසායක් විසින් 2020 ජුනි 26 වන දිනට ගෙවීමට නියමිත සහ ගෙවිය යුතු පැහැර හරින ලද බදු හෝ හිඟ බදු සමථයකට පත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් සහන කාලයක් ප්‍රදානය කරනු ඇත.

4. කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරන ඕනෑම බදු පනතක දක්වා ඇති පරිදි 2020 මාර්තු 01 වන දින සිට 2020 ජුනි 30 කාල පරිච්ඡේදය තුල නියමිත පරිදි සිදු කළ යුතු ගෙවීම් හෝ වාර්තාවක් හෝ ප්‍රකාශයක් ගොනු කිරීම සිදු නොකල තැනැත්තෙකු එකී කාර්යයන් 2020 දෙසැම්බර් 31 වන දින හෝ එදිනට පෙර සිදු කලේ නම් එය නියමිත පරිදි නිසි වේලාවට සිදු කල ලෙසට සැලකෙනු ඇත.

**2.1.10 2020 වර්ෂයේ එ.අ.බ. සම්බන්ධයෙන් වන ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්**

1. 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු (එ.අ.බ.) සඳහා ලියාපදිංචි වීමේ සීමාවන් කාර්තුවකට රුපියල් මිලියන 3 සිට රුපියල් මිලියන 75 දක්වා ද වර්ෂයකට රුපියල් මිලියන 12 සිට රුපියල් මිලියන 300 දක්වා ද ඉහළ නංවා ඇත.

2. බදු අය කළ හැකි ක්‍රියාකාරකමක නිරත වන තැනැත්තෙකු, එකී තැනැත්තා 2020.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එ.අ.බ. සඳහා ලියාපදිංචි වීමේ සීමාව යටතට නොවැටෙන්නෙකු වුවද ලිඛිත ඉල්ලුම් කිරීමක් ඉදිරිපත් කිරීමෙන් එ.අ.බ. සඳහා ස්වේච්ඡාමය ලියාපදිංචි වීම සඳහා වන අවසරය ප්‍රදානය කරනු ලැබේ.

3. 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණ සහ සක්‍රිය සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් වේ.

4. 2020.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග ලියාපදිංචි වූ සංචාරක නියෝජිතවරයෙකු විසින් සිදු කරන දේශීය සංචාර සම්බන්ධයෙන් වන සේවා සැපයීම බද්දෙන් නිදහස් වේ.

5. 2020.01.01 දි සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කළ ජාතිය ගොඩනැගීමේ බදු සහ එ.අ.බ. අනුප්‍රමාණයන් අඩු කිරීමට සමගාමීව, අපනයන අභිමුඛ ආයෝජන මණ්ඩල සමාගම් විසින් සමහර නිමි ඇඳුම් දේශීය වශයෙන් විකිණීමේදී කැලි පදනම් කර ගත් එ.අ.බ. අනු ප්‍රමාණය රු.100 සිට රු.25 දක්වා අඩු කර ඇත.

6. යෝජිත පනත බලාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි එ.අ.බ. සඳහා ලියාපදිංචි වීමේ සීමාවන් වැඩි කිරීම සහ ස්වේච්ඡාමය ලියාපදිංචිය හඳුන්වාදීම යනාදියට සමගාමීව තොග හා සිල්ලර වෙළඳාම සම්බන්ධයෙන් හඳුන්වාදුන්, එ.අ.බ. සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් විසින් සපයනු ලබන සැපයුම් එකතු කළ අගය මත බද්දට ඇතුලත් සැපයුම් ලෙස සැලකීමට අදාල විධිවිධාන ඉවත් කිරීමට පියවර ගෙන ඇත.

7. පශ්චාත් කොවිඩ් -19 ආර්ථිකය පුනර්ජීවනය සඳහා වූ බදු සහන ක්‍රියාමාර්ගය

1. අපනයන අභිමුඛ ආයෝජන මණ්ඩල සමාගම් විසින් සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ සහ ඒ හා සමාන නිෂ්පාදන සෞඛය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට, ත්‍රිවිධ හමුදාවට, ශ්‍රී ලංකා පොලිසියට සහ කොවිඩ් මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි ඔවුන්ට සපයන/ පරිත්‍යාග කරන ප්‍රමාණයන් බද්දෙන් නිදහස් කර ඇත.

2. 2020 මැයි සිට 2020.12.31 දක්වා කොවිඩ් වසංගතයට මුහුණ දීම සඳහා සෞඛ්‍ය සේවයේ ප්‍රතිපාදන සඳහා අවශ්‍ය වෛද්‍ය, ශල්‍යකර්ම හා දන්ත උපකරණ. මෙවලම්, උපාංග සහ ඒවායේ කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ භාණ්ඩ සහ ඖෂධ, රසායන ද්‍රව්‍ය හා ඒ හා සමාන අයිතමයන් ඇතුලු යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න ආනයනය හෝ ආනයනය හා සැපයීම හෝ ආනයනය හා පරිත්‍යාග බද්දෙන් නිදහස් කර ඇත.

**2.1.11 බදු ඉවත් කිරීම**

2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික සේවා ගාස්තු ඉවත් කෙරුණි.

2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ණය ආපසු ගෙවීම් බද්ද ඉවත් කෙරුණි.

**2.1.12 වර්ෂය තුල පනවන ලද අණ පනත්**

2020 අංක 03 දරණ ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

